
# මල්ලි දිනුම්



අකිත්‍රා අලහකෝන්

# මල්ලි දිනුම්

## අකිත්‍රා අලහකෝන්

(කතෘ)

පළමු දිගහැරීම

මහාමායා බාලිකා විදුහල, මහනුවර

6 ශ්‍රේණිය G

2026 මැයි 10

ISBN : 978-624-211-221-3

# පිදුම

මගේ ආදරණීය අම්මාටත්, අප්පච්චීටත්,
මල්ලීටත් මා හට අකුරු කළ සියලුම
ගුරු මෑණිවරුන්ට හා පියවරුන්ටත්
සෙනෙහසින් පුදමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.


සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍යා දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍යා දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10




මගේ නම මිනුලි. මගේ ප්‍රියතම ක්‍රීඩාව චෙස්.

මට චෙස් තරඟ වලින් දිනලා ලැබුණු සහතික, කුසලාන, පදක්කම් ගොඩාක් තියෙනවා.

එතකොට මගේ දඟ මල්ලි...??

එයත් චෙස් වලට හරිම කැමතියි.

චෙස් අදින හැටි එයාටත් කියලා දෙන්න කියලා මට හරිම කරදරේ.



ඉතින් මම එයාට චෙස් ඉත්තන්ගේ නම් කියලා දෙනවා.

මල්ලීට චෙස් ඉත්තන්ගේ නම් ඔක්කොම වගේ මතකයි. එයාට චෙස් බෝඩ් එකත් හරියටම හදන්න පුළුවන්.

ඔහොම කාලය ගෙවිලා ගියා.

දැන් මල්ලි ඉන්නේ පළමුවන ශ්‍රේණියේ. එයාටත් පාසලේ ක්‍රීඩාවක් තෝරා ගන්න කියා කියලා තිබුණා. ඉතින් එයා එක පයින් චෙස් ක්‍රීඩාවට කැමති වුණා.

මල්ලි හරිම ආසාවෙන් චෙස් පුහුණුවීම් වලට සහභාගි වුණා.



එක දවසක් මට සවස පාසලේ චෙස් පුහුණුවීම් වලදී මහනුවර කලාපයේ අන්තර් පාසල් චෙස් තරඟය පැවැත්වෙන බව දැනුම් දුන්නා. මම ගෙදර ආව ගමන්ම මල්ලීට ඒ ගැන කිව්වා.




මල්ලි කිව්වා එයාලගේ ගුරුතුමියත් ඒ තරඟය ගැන විස්තර කිව්වා කියලා.

“ඔයා මොකද කරන්නෙ මල්ලි? මේ චෙස් තරඟයට ඔයා යනවද?” කියලා මම ඇහුවා.

“ඔව්…ඔව්…මම අනිවාර් යයෙන් යනවා.” මල්ලි උඩ පැන පැන කිව්වා.

ඉතින් අප්පච්චී අපි දෙන්නගේම නම් තරඟයට ඉදිරිපත් කළා.

කොහොම වුණත් මට නම් පුංචි බයක් දැනුනා. මොකද මේක මල්ලිගේ පළවෙනි වෙස් තරඟය. ඒ වගේම තවත් ලොකු ප්‍රශ්නයක් මගේ හිතට ආවා. ඒ තමයි මල්ලි තරඟයක් පැරදුනාම මූණත් ඇඹුල් කරගෙන අඩන්න ගන්නවා.



තරඟෙට ගිහිල්ලත් මල්ලි අඩයිද??

මම ඒ ගැන නිතර හිතුවා.

ඔන්න ඉතින් දවස් ගතවෙලා වෙස් තරඟය පැවැත්වෙන දිනය ආවා.

අපේ ගෙදර හැමෝම එයට යන්න සූදානම් වුණා. තරඟය පැවැත් වුණේ අම්පිටිය මධ්‍ය මහා විද්‍යාලයේ.

මල්ලිගේ තරඟය තමයි මුලින්ම පටන් ගන්න නියමිත වෙලා තිබුණේ. ඉතින් අපි මල්ලිව තරඟ පැවැත්වෙන පන්ති කාමරයට එක්කරගෙන ගියා.



හොඳට තරඟ කරන්න කියලා මම මල්ලිට සුභ පැතුවා. ඊළඟට මම මගේ තරඟ පැවැත්වෙන ස්ථානයට ගියා.

පැයක් විතර ගත වුණාට පස්සේ මගේ පළමු වටය අවසන් වූණා. මම දිනුම්. මට හරි සතුටුයි.

ඒත් මල්ලිගේ තරඟ වටයට මොනව වුණාද මන්දා..?



මම පුළුවන් තරම් වේගයෙන් මල්ලිගේ පන්ති කාමරයට දිව්වා.



හපොයි..! මල්ලි පන්තියෙන් එළියෙ තියෙන බංකුවක වාඩිවෙලා හොඳටම අඬනවා. අම්මා මල්ලිගේ ඔළුව අතගානවා.

“මොකද වුණේ? ඇයි ඔයා අඬන්නේ” මම මල්ලිගෙන් ඇහුවා.

“මම පැරදුණා.” මල්ලි අඬන ගමන් කිව්වා.

ඔන්න එතකොටම වගේ මල්ලිගේ වෙස් ගුරුතුමිය එතනට ආවා.

“ඇයි පුතේ අඬන්නේ?” ගුරුතුමි මල්ලිගෙන් ඇහුවා. “ටීචර් මම මේ තරඟෙ පැරදුණා.” මල්ලි කිව්වා.

“පුතේ අපි ක්‍රීඩා කරද්දී ජය පැරදුම දෙකම එක විදිහට භාර ගන්න ඕනේ. අපි පැරදෙනකොට ගොඩක් දේවල් අලුතෙන් ඉගෙන ගන්නවා. අපේ හිත ශක්තිමත් වෙනවා. ඒ නිසා පුතා දැන් අඬන එක නවත්තන්න.” වෙස් ගුරුතුමිය මල්ලීට ආදරයෙන් කිව්වා.



මල්ලී වෙස් ගුරුතුමිය කිව්ව දේ හොඳට අහගෙන හිටියා. එයා අඬන එක නවත්තලා ගුරුතුමිය දිහා බලලා හිනා වුණා.

“මම එහෙනම් 13න් පහළ තරඟ පැවත්වෙන දිහාවට යනවා.” කියලා ගුරුතුමිය යන්න ගියා.

“කෝ දැන් මෙතන හිටපු මල්ලී...එයා පේන්න නැහැනේ. කොහෙ ගියාද?” මම කළබල වෙලා අම්මාගෙන් අහන ගමන් වටපිට බැලුවා.

ආ.... අර ඉන්නෙ මල්ලී.



මල්ලී එයත් එක්ක පළමු වටයේ සෙල්ලම් කරපු යාළුවගේ අතින් අල්ලගෙන එයාගේ අනිත් යාළුවො ඉන්න පැත්තට දුවනවා.

ක්‍රීඩාවෙන් අපිට ඉගෙන ගන්න තියෙන ලොකුම පාඩම තමයි ජය පැරදුම දෙකම එක විදිහට භාර ගන්න එක.

ඉතින් මල්ලිගේ ඉදිරි තරඟ වට කොහොම ඉවර වුණත් මල්ලි ඒ ඔක්කොම දින්නා වගේ ලොකුම ලොකු සතුටක් මට දැනුනා.

නිමි.



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)